# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# 2012

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, නාගරික හා වතු ජනතාවගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන් සපුරාලමින්, සමුපකාර ව්‍යාපාරය කෘෂි, ධීවර, හා කාර්මික යන අංශ වල මෙන්ම සේවා අංශය තුළත් ප්‍රාථමික සමුපකාර සමිති, ද්විතීයික සමුපකාර සංගම් හා ජාතික මට්ටමේ සමුපකාර සංගම් ලෙස දිවයින් පුරා ව්‍යාප්ත වී ඇත. මෙම සමිති හා සංගම් වල ව්‍යවස්ථාපිත විගණන හා සංවර්ධන අවශ්‍යතා ඉටු කරමින් සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා රාජ්‍ය අංශයේ දායකත්වය ලබාදීමට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කැප වී ඇත. විශේෂයෙන් සමුපකාර සමිති වල ලාභදායිත්ව මෙන්ම එමගින් ඉටු කරනු ලබන පුළුල් වූ සමාජ මෙහෙවර පිළිබඳ අවධානය යොමු කරමින් අවශ්‍ය සානු බලය සැපයීමට කටයුතු කරනු ලැබේ. පළාත් සභා ක්‍රමය ස්ථාපනය කිරීමෙන් අනතුරුව මෙම කටයුතු පළාත් සමුපකාර අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නවයක් හා මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත විමධ්‍යගත කරනු ලැබීය.

සමුපකාර ව්‍යාපාරය ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සානු බල සපයමින් සමුපකාර සමිති වල යහ පාලනය ගොඩ නැගීම සඳහා පුළුල් ලෙස මැදිහත්වීම මෙහෙවර කරගත් මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයේ නව පියවර කිහිපයක් තබමින් මෙම වර්ෂය තුල ග්‍රාමීය බැංකු නියාමන ඒකකයක් පිහිටුවීමට සැලසුම් කිරීම හා අලෙවි සංවර්ධන ඒකකයක් පිහිටුවීමේ මූලික කටයුතු ඇරඹීම ද සමුපකාර ව්‍යාපාරය ලද සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය නව්‍යතාවයකින් ඉදිරිපත් කිරිමට සැලසුම් කිරීම හා අප දෙපාර්තමේන්තුව සඳහා නිල ලාංඡනයක් නිර්මාණය කිරීමට සැලසුම් කිරීම මෙම වර්ෂය තුළ සිදු කළ වැදගත් සිදුවීම ලෙස සඳහන් කළ හැකිය. මෙම සියළු ඉලක්කයන් ඉදිරි වසර තුළ ළගා කර ගැනීමට අපේක්ෂිතය.

සමුපකාර ව්‍යාපාරයේ හර පද්ධතිය හඳුනාගනිමින් මහින්ද චින්තන ඉදිරි දැක්ම වැඩපිළිවෙල යටතේ ජාතික සංවර්ධනයට සමුපකාරය දායක කර ගැනීමට වත්මන් ගරු අමාත්‍යතුමාගේ මෙන්ම ලේකම්තුමාගේ කැපවීම, මඟපෙන්වීම සමුපකාර ව්‍යාපාරයේ උන්නතියට මහත් රුකුලක් වී ඇත. මෙම කර්තව්‍යය වඩාත් ඵලදායීව ඉටු කිරිම සඳහා අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ කටයුතු, කළමනාකරණ උපදේශන සේවා සැපයීම මෙන්ම විචාර පූර්වක ආකල්පයෙන් යුතු සමුපකාර සාහිත්‍යයක් ගොඩනැගීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ.

මෙම ක්ෂේත්‍රයට අයත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයත් සමුපකාර සේවක කොමිෂන් සභාවත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සහජීවනයෙන් කටයුතු කරන ආයතන වන අතර පළාත් සමුපකාර අමාත්‍යාංශ හා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග යහපත් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම අගය කළ යුතුව ඇත. එසේම ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය ඇතුළු සමුපකාරික ආයතන මෙන්ම සමුපකාරික ප්‍රජාව හා එක් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ඉදිරියට යාමට හැකිවීම ද අගය කළ යුතු කරුණකි.

වාණිජකරණයට ලක්වී ඇති වර්තමාන සමාජය තුළ සමුපකාර හර පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් සාමාජික අවශ්‍යතා සපුරාලීම සමුපකාර ව්‍යාපාරයට අභියෝගයක් වී තිබේ. උපායශීලිකළමනාකරණ ක්‍රියාවලියක් තුළින් මෙම අභියෝග ජයග්‍රහණය කර ගැනීමට සියළු සමුපකාර නායකයින්ගේ අවධානය යොමු විය යුතු බව පෙන්වා දීමට කැමැත්තෙමි.

අභියෝගයන්ට මුහුණපා ඇති සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කරමින් ජාතික සංවර්ධනයට දායක කර ගැනීම සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ සිදු කළ කාර්යභාරය ඒ සඳහා උපයෝජනය කළ සම්පත් මෙන්ම ජාතික මට්ටමේ සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති වල කාර්ය සාධනය අන්තර්ගත කරමින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන මෙම නිල වාර්තාව 2012 වර්ෂය සඳහා ද සකස් කර ඔබ අතට පත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ හා ලෝක ප්‍රජාවගේ තිරසාර සංවර්ධනය සඳහා ප්‍රශස්ථ ලෙස දායක වීමට ශක්තිය, ධෛර්ය හා අවකාශයන් සියළු සමුපකාරිකයන් වෙත ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ඩබ්ලිව්. එච්. කරුණාරත්න**
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

## දර්ශනය

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය

ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා

සානුබල සපයමින්,

සමුපකාර සමිතිවල යහ පාලනය

ගොඩනැගීම සඳහා

පුළුල් ලෙස මැදිහත් වීම.

# පටුන


1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය
   - 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය
   - 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
   - 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
     - 1.3.1 කාර්යමණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
     - 1.3.2 කාර්යමණ්ඩල විශ්‍රාම ගැන්වීම්
     - 1.3.3 ස්ථාන මාරුවී ගිය නිලධාරින්
     - 1.3.4 නව පත්වීම්/ ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරින්
   - 1.4 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය
     - 1.4.1 දේශීය පුහුණු
     - 1.4.2 විදේශීය පුහුණු
2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්
   - 2.1 වර්ෂය තුල ක්‍රියාත්මක සමුපකාර සමිති / සංගම් ලියාපදිංචි කිරීම් හා ඈවර කිරීම්
   - 2.2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම්
   - 2.3 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
   - 2.4 නීති කටයුතු
     - 2.4.1. 2012 වර්ෂය තුළ සමුපකාර සමිති/ සංගම් වල ආරවුල් බේරුම් කිරීම හා ප්‍රදානයන් බල ගැන්වීම
     - 2.4.2. 2012 වර්ෂය තුළ අවසන් වූ නඩු
     - 2.4.3. සමුපකාර සමිති / සංගම් පිළිබඳ පර්යේෂණ
   - 2.5 අරමුදල් කළමනාකරණය
     - 2.5.1 සමුපකාර සංවර්ධන අරමුදල
     - 2.5.2 සමුපකාර සංවර්ධන අතිරික්ත අරමුදල
   - 2.6 සංවර්ධන කටයුතු
3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
4. දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති
   - 4.1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
     - 4.1.1. දීප ව්‍යාප්ත ආයතනික සේවක ස.ණ.ස. සමිති
     - 4.1.2. දීප ව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමිති
   - 4.2 දීප ව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමිති
5. උපලේඛන

# 01 පරිච්ඡේදය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## 1. 1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 1930 වසරේදී සමුපකාර දෙපාර්තමේන්තුව ලෙස ආරම්භ වී 1945 වසරේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපිත විය. එය වර්තමානයේදී අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරන ස්ථානයේ පිහිටා ඇත.

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්**

- අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති, සංගම් ලියාපදිංචිය.
- ලියාපදිංචි සමුපකාර සමිති, සංගම් හා තෘතීය සමුපකාර ආයතන වල ව්‍යවස්ථාපිත කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කිරීම.
- පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාර ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම.
- ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහාය වීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වය සැපයීම.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවටම අනන්‍ය වූ කාර්යයන් ද වේ. ඒ අතරින් ප්‍රමුඛත්වය හිමි කාර්යයන් පහත සඳහන් වේ.

**සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු**

- සමිති ලියාපදිංචි කිරීම
- සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- නිළවරණ කටයුතු

- මහා සභා කැඳවීම/ කාරක සභා කැඳවීම
- මහා සභා පැවැත්වීම/ වලංගු භාවය තීරණය කිරීම
- ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- තීරකකරණ කටයුතු සහ උසාවි බලගැන්වීම්
- සමුපකාර සමිති/ සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

## සමුපකාර සමිති කළමනාකරණයට අදාළ කටයුතු

- පාලක මණ්ඩල පත් කිරීම/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
- විගණන කටයුතු
- පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය/ විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

## සම්බන්ධීකරණ කටයුතු

- සමුපකාර අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.

- පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට සහය වීම.

- ජාත්‍යන්තර සමුපකාර සන්ධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය

- සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය

- සමුපකාර සමිති වලට අදාල සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය

- වී මිලදී ගැනීම, සහන මිලට පොහොර බෙදාහැරීම වැනි කටයුතු වලදී සමුපකාර සමිති, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම

- සමුපකාර සමිති/ සංගම් අතර සම්බන්ධීකරණය

### සංවර්ධන කටයුතු

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම.
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාල කටයුතු ඉටු කිරීම.
- ❖ සමුපකාර සමිති හා සංගම් වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම.
- ❖ සමුපකාර සමිති හා සංගම් වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය.
- ❖ සංවර්ධන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම.
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය.
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ සේවක / නිලධාරි සුභ සාධනය.

### අරමුදල් පාලනය

- ❖ දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය.
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන්කරනු ලබන දායක මුදල් අයකර ගැනීම.
- ❖ සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබා දීම.
- ❖ ණය ආපසු අයකරගැනීම.
- ❖ ඵලදායි ලෙස අරමුදල් ආයෝජනය කිරීම.

### අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු


- ❖ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය.
- ❖ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය.
- ❖ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වර්ධනය.
- ❖ දෙපාර්තමේන්තු වත්කම් කළමනාකරණය.

## 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2012 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 06 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්

1. පරිපාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 1. 3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

කළමනාකරණ ප්‍රතිසංස්කරණ සංසද වැඩපිළිවෙලට සමාගමීව දෙපාර්තමේන්තුවේ ඵලදායිතා කව විසින් කාර්යාල පිරි සැලැස්ම නැවත සැලසුම් කිරීම මෙම වසර තුලදී සිදුවිය. එමගින් කාර්ය මණ්ඩලය සඳහා ප්‍රියමනාප ලෙස තම රාජකාරි කටයුතු ඉටු කිරිමට හැකි පරිසරයක් නිර්මාණය විය. දෙපාර්තමේන්තුවේ සෑම අංශයක්ම නව්‍යතාවයෙන් යුතුව සකස් කිරිම මෙම වසර තුළ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙසට සඳහන් කළ හැකිය.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I/II ශ්‍රේණි සඳහා තනතුරු 4 ක් අනුමතව තිබුණ ද 2012.09.26 දින දක්වා සේවයේ යෙදී සිටියේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ එක් නිලධාරිනියක් පමණක් වුවත් 2012-09-27 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නවක නිලධාරියකුගේ පැමිණීමත් සමඟ එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. එමෙන්ම වසර ගණනාවක සිට පුරප්පාඩුව පැවති පරිපාලන නිලධාරි තනතුර සඳහා නිලධාරිනියක අනුයුක්ත කිරීම හේතු කොට ගෙන එම තනතුරෙහි පුරප්පාඩුව සම්පූර්ණවීම 2012 වසර තුළ කාර්ය මණ්ඩලයෙහි සිදුවූ සුවිශේෂි සිදුවීමකි.

දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්, සමුපකාර සංවර්ධන නිලධාරි I,II,III ශ්‍රේණි සඳහා වූ බඳවා ගැනීම් සහ උසස්වීම් පරිපාටි අළුතින් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම ද මෙම වසර තුල සිදු කරන ලද තවත් සුවිශේෂී සිදුවීමකි.

දිවයිනේ සමුපකාර සංවර්ධන ක්ෂේත්‍ර කටයුතු සඳහා භාවිතා කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 02 ක් ලබා දීමද මෙම වසරේ සිදු වූ සුවිශේෂි සිදුවීමකි.

| වාහන වර්ගය | අංකය | දිනය |
|---|---|---|
| TOYOTA HIACE | WPNB3235 | 2012-05-15 |
| TOYOTA DOUBLE CAB | WPPE-0201 | 2012-05-21 |

## 1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු

2012.12.31 දිනට මෙම දෙපාර්තමේන්තුවෙහි අනුමත තනතුරු හා එම තනතුරු සංඛ්‍යාව, සේවයේ යෙදී සිටි සංඛ්‍යාව හා පුරප්පාඩු පහත සඳහන් පරිදි වේ.

| | සේවය / තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී.ලං.පරි.සේ. I) | 01 | 01 | - |
| 02 | සමුපකාර සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.පරි.සේ. II) | 04 | 02 | 02 |
| 03 | ගණකාධිකාරි (ශ්‍රී.ලං.ගණ.සේ. II/III) | 01 | - | 01 |
| 04 | සමුපකාර සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු) | 02 | 01 | 01 |
| 05 | සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි | 05 | 02 | 03 |
| 06 | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 07 | භාෂා පරිවර්තක | 01 | - | 01 |
| 08 | සමුපකාර සංවර්ධන නිලධාරි | 25 | 10 | 27 |
| 09 | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 37 | 25 | |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 20 | 08 |
| 11 | රියදුරු | 05 | 04 | 01 |
| 12 | කාර්යාල කාර්ය සහායක | 15 | 09 | 06 |
| | **උප එකතුව** | 125 | 75 | 50 |

## 1.3.2 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්

| | නම | තනතුර | විශ්‍රාම ලැබූ දිනය |
|---|---|---|---|
| 1 | එම්.ඒ. එම්. බී. එස්. ප්‍රනාන්දු මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර (අධිශ්‍රේණිය) | 2012-06-28 |

## 1.3.3 නව පත්වීම් / ස්ථානමාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | බී. ජී. සුනිල් ශාන්ත මයා | රියදුරු I | 2012-02-01 |
| 2 | එම්. ජී. ඕ. බුද්ධික ගමගේ මයා | සමුපකාර සංවර්ධන නිලධාරි I | 2012-05-14 |
| 3 | ඩී. ඒ. එස්. බුලත්සිංහල මයා | සමුපකාර සංවර්ධන නිලධාරි I | 2012-06-01 |
| 4 | එච්. ජී. වි. ආර්. සෝමවර්ධන මිය | පරිපාලන නිලධාරි | 2012-07-19 |
| 5 | එන්. එස්. විජේසිංහ මයා | සමුපකාර සංවර්ධන නිලධාරි I | 2012-08-01 |
| 6 | කේ. එල්. ඩී. අසේල මයා | ශ්‍රී.ලං.පරි.සේ. III<br>සහකාර කොමසාරිස් (සංවර්ධන) | 2012-09-26 |
| 7 | කේ. ආර්. ටී. සෝමරත්න මෙය | අභ්‍යාසලාභි උපාධිධාරි | 2012-10-19 |
| 8 | ජී. ආර්. ජේ. ජයවර්ධන මයා | කාර්යාල කාර්ය සහායක III | 2012-12-03 |
| 9 | එච්.එම්.ඒ. එස්. හේරත් මිය | අභ්‍යාසලාභි උපාධිධාරි | 2012-12-04 |
| 10 | ජී.එම්.ආර්.ඩී. තෙන්නකෝන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2012-12-10 |
| 11 | එච්.එම්.පි.එම්. රූපරත්න මෙය | අභ්‍යාසලාභි උපාධිධාරි | 2012-12-26 |

## 1.3.4 ස්ථාන මාරුවී ගිය නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය |
|---|---|---|---|
| 1 | ඩී. ඒ. එස්. මනතුංග මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2012-01-03 |
| 2 | ඩී.ජී. එච්. ඩී. පෙරේරා මයා | නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) | 2012-03-02 |
| 3 | එච්. ආර්. සචී මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2012-04-23 |
| 4 | කේ.ඒ.එස්. ජී. නයනප්‍රිය මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-07-31 |
| 5 | එම්. ඒ. ඩී. අයි. මාරසිංහ මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-07-31 |
| 6 | බී.ජී ජයමන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2012-09-05 |
| 7 | පී.ජී.එම්. මල්කාන්ති මෙය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-09-07 |
| 8 | එච්.බී. ආර්. ජයමිණි මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-09-14 |
| 9 | ජී.එම්.පී. ආරියදාස මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-09-14 |
| 10 | එච්. පී. ඒ. චන්දන මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-09-14 |
| 11 | එම්. ඒ. ජී. විජේසුන්දර මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2012-09-14 |
| 12 | පී.ඩී. වීරකෝන් මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2012-09-16 |
| 13 | ආර්. ජේ. කළංසූරිය මිය | කාර්යාල කාර්ය සහයක III | 2012-09-20 |
| 14 | බි.ජී. සුනිල් ශාන්ත මයා | රියදුරු I | 2012-12-01 |

## 1.4 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් සහ සංවර්ධනය

### 1.4.1 දේශීය පුහුණු

2012 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | ආයතනය | පැවැත්වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|---|
| 1 | ස්වාරම්භක පුහුණුව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2012.01.16 සිට 2012.01.31 | අයි.එස්. තෙවරප්පෙරුම මිය<br>එස්.ඒ. තලන්ගම මයා<br>කේ.කේ. කුමාර මයා<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 2 | එක්දින රියදුරු පුහුණු වැඩමුළුව | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 2012-02-27 | එම්. දීපාල් නිරෝෂන් මයා<br>(රියදුරු) |
| 3 | රාජ්‍ය වැටුප් කළමනාකරණ පද්ධතිය | මිලෝදා ආයතනය | 2012.03.05 සිට 2012.03.12 | එස්.එච්. මදුරාවල මිය<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 4 | කාර්යාල ක්‍රම | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 2012-03-05<br><br><br><br><br><br><br><br>2012-03-12 | ඩබ්.ඒ.එන්. බන්ඩාරනායක මිය<br>බී.ජී. විනිතා මිය<br>බී. ප්‍රේමරත්න මයා<br>ආර්.එල්.එම්. මල්කාන්ති මිය<br>ඒ.ඒ.සී.එස්. අමරසිංහ මිය<br>කේ.එම්. මිනෝලි මෙය<br>පී.කේ.සි. නිලංගිකා මෙය<br><br>(රාජ්‍ය කළමනාකරණ සහකාර)<br><br>කේ.ආර්.ඩී. නිලන්ති මිය<br>එස්.එච්. මදුරාවල මිය<br>ආර්.එම්.පී.එස්. රත්නායක මයා<br>එම් මයුරි මෙය<br><br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 5 | වැටුප් පරිවර්තන | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2012-06-20 | පි.ඩී. වීරකෝන් මිය<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 6 | ප්‍රධාන ලිපිකරු භූමිකාව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2012-06-21<br>2012-06-22 | පි.එම්. පතිරත්න මිය<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 7 | මුදල් අයකැමිගේ කාර්යභාරය හා වගකීම් | පුහුණු සංවර්ධන අරමුදල් ආයතනය | 2012-11-05 | උමේෂ් නිශාන්ත මයා<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |

| | පුහුණු වැඩසටහන | ආයතනය | පැවැත්වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|---|
| 8 | තුලනාත්මක කාර්ය සාධනය | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | 2012-11-08 | එම්.බී.එස්.ඒ. ද සිල්වා මිය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 9 | නායකත්ව හා පෞරුෂ සංවර්ධනය | නිපුණතා සංවර්ධන අරමුදල් ආයතනය | 2012-11-17 | කේ.එල්.ඩී. අසේල මයා (සහකාර කොමසාරිස් සංවර්ධන) |
| 10 | සඵලදායිතාවය සඳහා කාල කළමනාකරණය | කුසලතා සංවර්ධන අරමුදල් ආයතනය | 2012-11-20 | ජී. ජී. දයාසුමන මයා (සමුපකාර දිස්ත්‍රික් නිලධාරි) |
| 11 | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය | කුසලතා සංවර්ධන අරමුදල් ආයතනය | 2012-11-29<br>2012-11-30 | උමේෂ් නිශාන්ත මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 12 | ආපදා අවදානම් අවම කිරීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2012-11-19<br>සිට<br>2012-11-30 | වයි. ඩී. ඩයනා කුමාරි මෙය (සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර) |
| 13 | ගිණුම්කරණ ප්‍රමිත වැඩමුළුව | ප්‍රාග් ආයතනය | 2012-11-22 | පී.ඒ.එස්. ආනන්ද මයා (සමුපකාර දිස්ත්‍රික් නිලධාරි) |
| 14 | නායකත්ව හා කණ්ඩායම් හැඟීම් ගොඩනැගීම | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය | 2012-11-28<br>2012-11-29 | ජේ.එච්.එස්.එම්. අබේනායක මයා (සහකාර කොමසාරිස් - නීති /විගණන) |
| 15 | ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යාල කළමනාකරණය | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය | 2012-12-06<br>2012-12-07<br>2012-12-13<br>2012-12-14 | ඒ.ඒ.සී.එස්. අමරසිංහ මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |

## 1.4.2 විදේශීය පුහුණු

2012 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන, පුහුණු ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී ඇත.

| | වැඩසටහන | කාලපරිච්ඡේදය | සහභාගි වූ නිලධාරින් |
|---|---|---|---|
| 1 | Programme on Women's Development through Income Generation Activities (India) | 2012-01-30<br>2012-02-02 | Mr. H.P.A. Chandana<br>Mr. B.K.B.S. Rodrigo<br>(Co-op promotion & Investigative Assistant) |
| 2 | Asian Pacific Zonal co-operative Minister's Conference (Bangkok) | 2012-02-25<br>2012-03-02 | Mr. W.H. Karunarathna<br>(Commissioner of Co-op Development) |
| 3 | International trainers Training Programme on Restructuring and Strengthening Agricultural/Rural Financing Institutions' (India - Pune) | 2012-06-04<br>2012-06-08 | Ms. T.N.K. Senarathna<br>Ms. H. B.R. Jayamini<br>(Co-op Promotion & Investigative Assistant) |
| 4 | International Co-operative conference on " Cooperative Enterprises build a better world" (India - New Delhi) | 2012-07-04<br>2012-07-05 | Mr. W.H. Karunarathna<br>(Commissioner of Co-op Development) |
| 5 | 6th Credit Union/ Cooperative Regulators workshop and asian Credit Union Forum 2012 (phillippines) | 2012-09-05<br>2012-09-09 | Mr. W.H. Karunarathna<br>(Commissioner of Co-op Development) |
| 6 | Educational tour which is conducted by the university of sentrosis (Russia) | 2012-09-12<br>2012-09-19 | Ms. M.R. Priyantha<br>(Co-op development Officer) |
| 7 | International workshop on identify strategy and development management in the globed environment (India) | 2012-10-01<br>2012-10-05 | Mr. R. Muralitharan<br>(Co-op Promotion & Investigative Assistant) |
| 8 | ICA EXPO - 2012 (Exhibition) (England) | 2012-10-28<br>2012-11-04 | Mr. W.H. Karunarathna<br>(Commissioner of Co-op Development) |
| 9 | Programme on a women's Development through Micro Finance' (India - Pune) | 2012-12-10<br>2012-12-13 | Ms. W.N.S. Weerakkody<br>Ms. K.I. Perera<br>(Co-op Promotion & Investigative Assistant) |

## මහජන බැංකු ආධාර මගින් සිදුකරනු ලැබූ පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | පැවැත් වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|
| 01 | රජයේ බදු සහන සහ ඒවා ඵලදායිව යොදා ගැනීම | 2012-01-31 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 02 | ව්‍යාපෘති වාර්තා සැකසීම සහ එම වාර්තා ඇගයීම i | 2012-03-09 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 03 | මාධ්‍ය පුහුණු වැඩමුළුව | 2012-03-16 | සමූපදීපනී දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් |
| 04 | දේශය ගොඩනැංගවීමේ අපසතු වගකීම හා කාර්යභාරය පිළිබඳ සෞන්දර්යාත්මක දෙසුම | 2012-03-31 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 05 | සමුපකාර ග්‍රාමීය බැංකු / බැංකු කටයුතු කරනු ලබන සමිති නියාමනය කිරීමේ සැලසුම් සකස් කිරීම | 2012-04-27<br>2012-04-28 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 06 | අන්තර්ජාලය සහ විද්‍යුත් තැපෑල භාවිතය | 2012-05-14<br>2012-05-15 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 07 | කාර්යාල ක්‍රම | 2012-06-01<br>2012-06-08 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 08 | ජුම්ලා මෘදුකාංගය | 2012-06-14 | වෙබ් අඩවි කමිටු සාමාජිකයින් (දෙපාර්තමේන්තු නිලධාරින්) |
| 09 | ව්‍යාපෘති වාර්තා සැකීම සහ එම වාර්තා ඇගයීම ii | 2012-06-21 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 10 | කොටස් වෙළඳපොල ආයෝජනය | 2012-08-09 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 11 | තීරකකරණය | 2012-08-17<br>2012-08-18 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 12 | සමුපකාර ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන නියාමනය කිරීම | 2012-09-24 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 13 | තීරක තීන්දු උසාවි බලගැන්වීම | 2012-11-17 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |

# 02 පරිච්ඡේදය

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්

### 2.1 වර්ෂය තුල ක්‍රියාත්මක සමුපකාර සමිති/සංගම් ලියාපදිංචි කිරීම් හා ඈවර කිරීම්

**වර්ෂය තුල ලියාපදිංචි කළ නව සමුපකාර සමිති**

- සමු 41 - සී/ස සමස්ත ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය 2012-01-05
- සමු 42 - සී/ස ශ්‍රී ලංකා ශල්‍යගෝස් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය 2012-10-17

වර්ෂය තුල නව සංගම් ලියාපදිංචි කර නැත

වර්ෂය තුල සමිති / සංගම් ඈවර කිරීම් සිදුකර නැත.

### 2.2 සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම


2012 වර්ෂය තුලදී පහත සඳහන් සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනයන් අනුමත කර ඇත.

1. සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවකයින්ගේ සුභසාධක සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය 2012-01-05
2. සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය 2012-06-21
3. සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් සහ ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය 2012-09-05
4. සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය 2012-10-05
5. සී/ස මිනින්දෝරු (මැනුම්) දෙපාර්තමේන්තුවේ මැනුම් සහායකවරුන්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය 2012-10-26
6. සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්යය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය 2012-11-07

## 2.3 සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

මෙම දෙපාර්තමේන්තුවෙහි ව්‍යවස්ථාපිත වගකීම් යටතේ විගණනය කළයුතු ප්‍රාථමික සමුපකාර සමිති සහ ජාතික මට්ටමේ සමුපකාර සමිති/සංගම්වල 2008 සිට 2012 වර්ෂය දක්වා විගණන සැලසුම් සහ නිත්‍ය ප්‍රතිඵල පහත දැක්වේ.

| වර්ෂය | සැලසුම් කල විගණන | නිම කල විගණන | වර්ෂය තුල නිමකළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2008 | 56 | 51 | 91% |
| 2009 | 55 | 45 | 82% |
| 2010 | 58 | 53 | 91% |
| 2011 | 66 | 64 | 97% |
| 2012 | 83 | 63 | 76% |




## 2.4 නීති කටයුතු

නීති කටයුතු වලට අදාළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- සමුපකාර සමිති වලට සම්බන්ධ නීති රීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් විසින් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහාය ලබාදීම
- ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම
- සමුපකාර සමිති පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/සංගම් වලින් ඉදිරිපත් වන තීරක ආරවුල් විභාග කිරීම, ප්‍රදානයන් ලබා දීම, අභියාචනා විභාග කිරීම හා උසාවි බලගැන්වීම

- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරින් වගඋත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි, අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම

## 2.4.1 වර්ෂය තුළ සමුපකාර සමිති/සංගම් වල ආරවුල් බේරුම් කිරීම හා තීරක ප්‍රදානයන් බලගැන්වීම

| | |
|---|---|
| ◆ බේරුම් කර ඇති ආරවුල් සංඛ්‍යාව | ගොනු 353 |
| ◆ උසාවි බලගන්වා ඇති ප්‍රදාන සංඛ්‍යාව | ගොනු 564 |
| ◆ උසාවි බලගන්වා ඇති ප්‍රදානයන්හී වටිනාකම | රු.මි17.93 |

## 2.4.2 වර්ෂය තුළ අවසන් වූ නඩු

| නඩු අංකය | | පාර්ශවකාර සමිතිය |
|---|---|---|
| 728/2009 | - | සී/සඅධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ස.ණ.ස. සමිතිය |

## 2.4.3 සමුපකාර සමිති/ සංගම් පිළිබඳ පරීක්ෂණ

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ස.ණ.ස. සමිතිය පිළිබඳ 2011 වසර තුළ 46 (1) පරීක්ෂණයක් ආරම්භ කළ අතර ඊට අමතරව සමිති වලින් සහ විවිධ පාර්ශවයන් වෙතින් ලැබෙන නාමික හා නිර්නාමික පෙත්සම් විභාග හා පරීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී.

## 2.5 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර පනතේ 43 (1) (ආ) වගන්තිය සහ 57 (3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදලේ දායක මුදල් අයකර ගැනීම මෙන්ම වියදම් දැරීම, ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලැබේ.

- සමුපකාර අරමුදල
- සමුපකාර අතිරික්ත අරමුදල

## 2.5.1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදල ගරු අමාත්‍යතුමාගේ විධානයන්ට යටත්ව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් කළමණාකරනය කරනු ලබයි.

මධ්‍යම රජයේ මෙම අරමුදලට දායකත්වය දරනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත්වන සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති මගිනි. 2012 වර්ෂය තුළදී එම සමිති වලින් මෙම අරමුදල සඳහා ලැබී ඇති සමිති දායකත්වය රු. මි. 26.93 කි.

**මෙම වර්ෂයේදී සමුපකාර සංවර්ධන අරමුදලින් මූල්‍ය දායකත්වය ලබා දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.**

- "දැයට කිරුළ" වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශනය සඳහා වියදම් දැරීම
- විදේශීය පුහුණු වැඩසටහන් සඳහා වැය දැරීම
- දේශීය පුහුණු වැඩසටහන් සඳහා වැය දැරීම
- දැයට කිරුළ වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශණයට සමගාමීව කෝප් සිටි හා මෙගා කෝප් සිටි පිහිටුවීම සඳහා වැය දැරීම

**ණය ලබාදීම**

සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියේ සහල් සැකසුම් මධ්‍යස්ථානය නවීකරණය සඳහා රු. මි. 3 ක ණය මුදලක් ලබාදීම

## 2.5.2 සමුපකාර සංවර්ධන අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර පනතේ 57(3) වගන්තියේ හා සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44i සිට 44 iii දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූලාසනය වේ.

මෙම අරමුදලින් වර්ෂය තුලදී දිවයිනේ පිහිටි සමුපකාර සමිති වල කටයුතු වැඩිදියුණු කිරීම සඳහා සහන පොලී ප්‍රතිශතයක් යටතේ පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන සළසා ඇත.

## සමුපකාර අතිරික්ත අරමුදල - ණය ලබා දීම

| | ආයතනය | ලබා දුන් ණය මුදල රු.මි. | කාරණය |
|---|---|---|---|
| 1 | වි අලෙවි මණ්ඩලය | 450 | මහ කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු වෙනුවෙන් |
| 2 | සී/ස එප්පාවල විවිධසේවා සමුපකාර සමිතිය | 2 | මෙගා කෝප් සිටි ආරම්භ කිරීම සඳහා |
| 3 | සී/ස උතුරු මැද පළාත් පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 5 | ප්‍රාග්ධන ගැටළු විසඳා ගැනීම වෙනුවෙන් |
| 4 | සමුපකාර තොග වෙළඳ සංස්ථාව | 13.98 | විලච්චිය වි.සේ.ස. සමිතියේ වී ගබඩාව ඉදිකිරීමේ කටයුතු සඳහා |
| 5 | සී/ස කුරුණෑගල ආරෝග්‍ය ශාලා සමුපකාර සමිතිය | 62.5 | සමුපකාර රෝහල නවීකරණ කටයුතු වෙනුවෙන් |
| | **එකතුව** | 533.48 | |

## සමුපකාර අතිරික්ත අරමුදල - අධාර ලබා දීම

| | ලබාදුන් සමිතිය/ආයතනය | ආධාර මුදල රු.මි. | විස්තරය |
|---|---|---|---|
| 1 | සී/ස මාදම්පේ විවිධ සේවා සමුපකාර සමිතිය | 3.35 | සමිතිය සතු රංග ශාලාවේ වායු සමීකරණය වෙනුවෙන් |
| 2 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වයඹ පළාත | 0.5 | සී/ස නිකවැරටිය වි.සේ.ස. සමිතිය, සී/ස කොබෙයිගනේ වි.සේ.ස සමිතිය, සමුපකාර සාමාජික සංවර්ධනය හා සමාජ සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් |
| 3 | කු/ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විද්‍යාලය | 0.12 | ඕස්ට්‍රේලියාවේ පැවැත්වෙන නෙට්බෝල් තරඟාවලිය ට සහභාගි වීමට ගුවන් ටිකට්පත ලබා ගැනීම සඳහා |
| 4 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 22.5 | පර්චස් 200 ක ඉඩම සහ පිහිටි මන්දිරය මිලදී ගැනීම වෙනුවෙන් |
| 5 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 1.66 | පාසල් සමුපකාර සමිති සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම සහ කුරුණෑගල සමුපකාර රෝහල ඉදිකිරීම් ආරම්භ කිරීම |
| | **එකතුව** | 28.13 | |

## 2007 සිට 2012 දක්වා ණය ලබා දීම හා ණය අයවීම

| වර්ෂය | ණය ලබා දිම රු.මි | අයවීම රු.මි |
|---|---|---|
| 2007 | 12.5 | 15.08 |
| 2008 | 26.0 | 12.65 |
| 2009 | 31.5 | 33.19 |
| 2010 | 38.0 | 58.77 |
| 2011 | 381.0 | 286.90 |
| 2012 | 539.48 | 293.63 |

## 2.6 සංවර්ධන කටයුතු

දෙපාර්තමේන්තුව මගින් ඉටු කළ සංවර්ධන කටයුතු පහත සඳහන් පරිදි වේ.

| | සංවර්ධන ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ අරමුණ හා ප්‍රගතිය | වැය වූ මුදල රු.මි. |
|---|---|---|---|
| 1 | සමුපදීපනි සිංහල හා දෙමළ මාධ්‍ය පුවත් පත් අතිරේක පළ කිරීම | ශ්‍රී ලාංකික ජනතාව වෙත සමුපකාර තොරතුරු ලබා දීම හා ජනතාව සමුපකාර ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීම මෙම පුවත්පත් අතිරේකය පල කිරීමේ අරමුණ වේ.<br>දිවයිනම ආවරණය වන පරිදි දිණමිණ ජාතික පුවත්පත හා තිනකරන් පුවත්පත සමග සෑම මසකම අවසන් සිකුරාදා පළ කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුළ සිංහල මාධ්‍ය අතිරේක 12 ක් හා දෙමළ මාධ්‍ය අතිරේක 12 ක් පළ කරනු ලබයි. | 6.38 |
| 2 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන පුහුණු වැඩ සටහන් | දෙපාර්තමේන්තු (රේඛීය)පළාත් දෙපාර්තමේන්තු නිලධාරීන් හා සේවකයන් මෙන්ම සමුපකාරික ප්‍රජාව න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් දැනුවත් කිරීම මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ අරමුණ වේ.මෙම වසරේදි පුහුණු වැඩසටහන් 11ක් පවත්වා ඇත. | 1.15 |
| 3 | දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය | 2012 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල සමුප--කාර ආයතන සංවර්ධනය කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් කේන්ද්‍ර කර ගනිමින් පාසල් දරුවන්ට වසරක් පුරා දියර කිරි ලබා දීමට කටයුතු කර ඇත. තවද ළමා ප්‍රජාව අතර සමුපකාර ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම අරමුණු කර ගනිමින් ප්‍රදර්ශන භූමියේදී චිත්‍ර තරග හා දැනුම මිනුම තරග සංවිධානය කරන ලදී | 3.3 |
| 4 | පළාත් කොමසාරිස් සමුළුව | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබයි. මෙම සමුළුව මගින් රේඛීය දෙපාර්තමේන්තුව හා පළාත් දෙපාර්තමේන්තු අතර සහයෝගීතාව, තොරතුරු හුවමාරුව සහ පළාත් දෙපාර්තමේන්තු වලට අයත් සමුපකාර ආයතනයන්හි ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් සපයයි. | 0.37 |
| 5 | කෝප් නෙට් ව්‍යාපෘතිය | සමුපකාරික තොරතුරු ජාලගත කිරීමේ වැඩසටහන යටතේ ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය මගින් සමුපකාරිකයන්ට මෙන්ම අධ්‍යාපන කටයුතු වල නිරත වූවන්ට, පළාත් සමුපකාර දෙපාර්තමේන්තු වලට අදාළ සමුපකාර ක්ෂේත්‍රය සම්බන්ධ තොරතුරු සැපයීම අරමුණු කර ගනී. මෙම ව්‍යාපෘතිය 2012 මැද භාගයේදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය. | 1.54 |

| | සංවර්ධන ව්‍යාපෘතිය | ව්‍යාපෘතියේ අරමුණ හා ප්‍රගතිය | වැය වූ මුදල රු.මි. |
|---|---|---|---|
| 6 | සී/ස කුරුණෑගල ආරෝග්‍යශාලා සමිතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සමුපකාර රෝහල ඉදිකිරීම | මෙම ව්‍යාපෘතිය සඳහා සමුපකාර අරමුදල මගින් ණය ලබාදී ඇත. දෙපාර්තමේන්තුව මගින් ලබා දීමට යෝජිත ණය මුදලින් කොටසක් මෙම වසර තුළදී ලබා දී ඇත. ඉතිරි මුදල 2013 වසරේදී ලබා දීමට කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මගින් සහනදායි මිලකට සෞඛ්‍ය සේවා ලබා ගැනීමත් සාමාජික ප්‍රජාවට සහන සැලසීමත් අපේක්ෂා කරයි | 62.25 |
| 7 | සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතියේ සහල් සැකසුම් මධ්‍යස්ථානය නවීකරණය කිරීම | මෙම ව්‍යාපෘතිය සඳහා 2011 වසරේ මූලධන වැය යටතේ ආධාර කළ අතර ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා මෙම වසර තුළදී සමුපකාර අරමුදලින් ණය වශයෙන් මූල්‍යාධාර සපයා ඇත. | 3 |
| 8 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රාග්ධන සම්පත් වැඩි දියුණු කිරීම | ජාතික මණ්ඩලය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩමක් සහ ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා සමුපකාර අරමුදලින් මූල්‍යාධාර සපයා ඇත. | 22.5 |
| 9 | නිකවැරටිය මහසෙන් විද්‍යාලීය පිහිණුම් තටාකය ඉදිකිරීම | පාසල් සමුපකාර සමිති සාමාජිකයින් දිරිගැන්වීම හා නගා සිටුවීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත | 11.7 |
| 10 | පාසල් සමුපකාර සමිති සාමාජිකයින්ගේ ක්‍රීඩා කුසලතා වැඩි දියුණු කිරීම | කුරුණෑගල ශුද්ධ වූ පවුලේ බාලිකා විද්‍යාලීය පාසල් සමුපකාර සමිති සාමාජිකාවක් ඕස්ට්‍රේලියාවේ පවත්වන ලද නෙට්බෝල් තරඟාවලියකට සහභාගි කරවීම සඳහා සමුපකාර අරමුදලින් මූල්‍ය ආධාර සපයා ඇත. | 0.12 |
| 11 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් අතර මේස පන්දු ක්‍රීඩාව නැංවීම | මේ සඳහා සමුපකාර අරමුදලින් අනුග්‍රහය ලබා දී ඇත | 0.68 |
| 12 | මහපොළ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබන වැඩසටහනකි මෙම ප්‍රදර්ශනයේ සමුපකාර දෙපාර්තමේන්තු ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යමින් සමුපකාර ප්‍රජාව හා ළමා ප්‍රජාවතුල සමුපකාර ව්‍යාපාරය පිළිබඳ අවබෝධයක් ලබා දීමට කටයුතු කර ඇත. | 0.95 |
| 13 | වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය වෙත ණය මුදල් ලබා දීම | ජාතික අවශ්‍යතාවයක් හා මහින්ද චින්තන ප්‍රතිපත්ති මත ගොවීන්ගේ වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම | 450 |
| 14 | සමුපකාර දෙපාර්තමේ--න්තු පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | සමුපකාර දෙපාර්තමේන්තු (රේඛීය) පුස්තකාලය නවීකරණය කිරීම සඳහා පොත් මිලදී ගැනීමට කටයුතු කරන ලදී | 0.06 |

# 03 පරිච්ඡේදය

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

වර්ෂය තුල පහත සඳහන් ජාතික මට්ටමේ සමුපකාර සංගම්වල සංවර්ධනය හා ව්‍යවසාය කටයුතු මෙන්ම ඒවායෙහි අධීක්‍ෂණ කටයුතු ද දෙපාර්තමේන්තුව මගින් ඉටුකරන ලදී.

1. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
2. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය (ස.ණ.ස)
3. සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය
4. සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය (කෝප්ෆෙඩ්)
5. සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය (මාක්ෆෙඩ්)
6. සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය (සියෙස්ටා)
7. සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය
8. සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය (කෝප් ටෙක්ස්)
9. සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය
10. සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය (නිස්කෝ)
11. සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය
12. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති සම්පත් කළමණාකරණ සමුපකාර සන්ධානය
13. සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය
14. සී/ස ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය

(මෙම සමිති වල සාමාජික සංඛ්‍යාව හා සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු වාර්තාවේ අංක 02 දරන උපලේඛණයේ දක්වා ඇත.)

## 01. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො.2490 |
| ලියාපදිංචි දිනය | : | 1972/07/26 |

ජාතික හා අන්තර්ජාතික මට්ටමේදී ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය නියෝජනය කරන ස්වාධීන සංවිධානයක් ලෙස මෙම ආයතනය කටයුතු කරයි. ජාත්‍යන්තර සමුපකාර සංවිධානයෙහි ප්‍රථම ආසියානු කලාපීය සාමාජිකයා ලෙස මෙම ආයතනය හැඳින්විය හැකිය.

ව්‍යාපාරික හා සේවා අංශ :

- ආයතන හා පරිපාලන අංශය
- අධ්‍යාපන අංශය
- විදේශ අංශය
- බැංකු අංශය
- ගෘහ නිර්මාණ ශිල්පීය අංශය
- කෝප් සිමෙන්ති ආනයන අංශය
- ප්‍රකාශන අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 41 |
| සේවක සංඛ්‍යාව | | 49 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 922.0 |
| වර්ෂයේ ශුද්ධ ඌනතාවය | රු.මි. | 10.6 |

## 02. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය (ස.ණ.ස)

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො. 2651 |
| ලියාපදිංචි දිනය | : | 1980/11/10 |

තම සාමාජික සමිති හරහා ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට හා සකසුරුවම්කම වර්ධනය කිරීම සඳහා කටයුතු කරන මෙම සංගමය සමුපකාර ණයදෙන සමිති වල ජාතික මට්ටමේ අග්‍රස්ථ සමුපකාර සංවිධානය ලෙස සලකනු ලැබේ.

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 493 |
| සේවක සංඛ්‍යාව | | 18 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 435.3 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 4.3 |

## 03. සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය

ලියාපදිංචි අංකය : සමු. 17
ලියාපදිංචි දිනය : 1997/12/15

මෙම සංගමය ආරම්භ වී ඇත්තේ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම් මගින් ප්‍රාථමික මට්ටමේ ග්‍රාමීය බැංකු කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණ සහිතව වන අතර සංගමයේ කාර්යය වනුයේ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමයි.

ව්‍යාපාරික හා සේවා අංශ :

- නියෝජිත සේවා අංශය
- අධ්‍යාපන අංශය
- උකස් හා ඉතුරුම් අංශය
- මූල්‍ය අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 13 |
| සේවක සංඛ්‍යාව | | 13 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 912.2 |
| වර්ෂයේ ශුද්ධ ඌණතාවය | රු.මි. | 0.2 |

- නව වැඩසටහන් ක්‍රියාත්මක කිරිම තුලින් ඉදිරි වසර තුළ ඌණතා මග හරවා ගැනීමට සැලසුම් කරමින් පවති

## 04. සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය (කෝප්ෆෙඩ්)

ලියාපදිංචි අංකය : සමු. 01
ලියාපදිංචි දිනය : 1989.07.15

මෙම සංගමය මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ පාරිභෝගික කටයුතු වල නිරත සමුපකාර සමිතිවල කටයුතු පහසු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ඇත.

ව්‍යාපාරික හා සේවා අංශ

- සිල්ලර අංශය
- තොග වෙළඳ අංශය
- ගුවන් ටිකට්පත් අලෙවි අංශය
- සේවක පුහුණු අංශය
- නියෝජිත අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 257 |
| සේවක සංඛ්‍යාව | | 133 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 572 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 39 |

## 05. සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය (මාක්ෆෙඩ්)

ලියාපදිංචි අංකය : කො.2504
ලියාපදිංචි දිනය : 1973.03.01

මෙම සංගමය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශයෙහි ක්‍රියාත්මක වන සමුපකාර සමිතිවල නිෂ්පාදන මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ කටයුතු වල නියැලෙන ජාතික මට්ටමේ සමුපකාර සංගමයක් ලෙස සලකනු ලැබේ. මීට අමතරව පාරිභෝගික භාණ්ඩ ආනයනය කර සමුපකාර සමිති වලට අලෙවි කිරීමේ කාර්යයද කරනු ලැබේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- අලෙවි අංශය
- ඉන්ධන අංශය
- තලාව සහල් සැකසුම් අංශය
- ප්‍රවාහන අංශය
- කෘෂි අංශය
- ආනයනික ද්‍රව්‍ය අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 157 |
| සේවක සංඛ්‍යාව | | 107 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 500.3 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 11.2 |

## 06. සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය (සියෙස්ටා)

ලියාපදිංචි අංකය : කො. 2527
ලියාපදිංචි දිනය : 1974.03.19

මෙම සංගමය ශ්‍රී ලංකාවේ කාර්මික අංශයෙහි ක්‍රියාත්මක වන සමුපකාර සමිතිවල ජාතික මට්ටමේ සමුපකාර සංගමය ලෙස සලකනු ලැබේ.

ව්‍යාපාරික හා  සේවා අංශ

- රබර් මිශ්‍රිත කොහු මෙට්ට නිෂ්පාදන අංශය
- දඟර කොහු නිෂ්පාදන අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 186 |
| සේවක සංඛ්‍යාව | | 36 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 92.6 |
| වර්ෂයේ ශුද්ධ ඌණතාවය | රු.මි. | 3.96 |

## 07. සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය

ලියාපදිංචි අංකය : කො. 1086
ලියාපදිංචි දිනය : 1942.04.01

මෙම සංගමයෙහි ප්‍රධාන අරමුණ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි නිරත සමුපකාර සමිතිවල කටයුතු ප්‍රවර්ධනය කිරීම වේ. නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම, යෙදවුම් හා වෙනත් සේවාවන් ලබා දීම, නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැලසීම ඇතුළු අදාළ ක්ෂේත්‍රයන්හී සියලුම අංශවල සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- පොල්තෙල් නිෂ්පාදන අංශය
- පොල්තෙල් බෝතල් අංශය
- සබන් නිෂ්පාදන අංශය
- සිල්ලර වෙළඳසැල් අංශය
- පොදු අපනයන තැරැව් අංශය
- කිරි නිෂ්පාදන අලෙවිහල

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 08 |
| සේවක සංඛ්‍යාව | | 24 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 70.8 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 3.1 |

## 08. සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය (කෝප් ටෙක්ස්)

| | | |
|---|---|---|
| ලියාදිංචි අංකය | : | කො.2559 |
| ලියාපදිංචි දිනය | : | 1981.09.02 |

මෙම සංගමයේ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන මධ්‍යස්ථාන හොරණ ප්‍රදේශයේ මිල්ලෑව සහ මාහේනවත්ත යන ප්‍රදේශ වල පවත්වාගෙන යනු ලබයි. මීට අමතරව සාමාජික සමිති වලට තම නිෂ්පාදන අලෙවි කිරිමේ පහසුකම් සලසා දීම සහ රාජ්‍ය සේවකයින්ට ණය පදනමට නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු ද සිදුකරනු ලබයි. වර්ණ ගැන්වීම සහ නවීන මෝස්තර අනුව රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම සංගමය විසින් සිදු කරයි.

ව්‍යාපාරික හා සේවා අංශ

- නිෂ්පාදන අංශය
- ණය අලෙවි අංශය
- සිල්ලර අංශය
- ජංගම අලෙවි අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 12 |
| සේවක සංඛ්‍යාව | | 05 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 22.30 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 0.38 |

## 09. සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සමු.13 |
| ලියාපදිංචි දිනය | : | 1997.05.05 |

මෙම සංගමයෙහි මූලික අරමුණ කිරි නිෂ්පාදනය හා අලෙවි අංශ තුළ සමුපකාර සමිති කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීමය. මීට අමතරව තම සාමාජික සමිති සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබාදීම සිදුකරනු ලබයි.

ව්‍යාපාරික හා සේවා අංශ

- බෙදාහැරීමේ අංශය
- විකුණුම් අංශය
- උපකරණ අංශය

| | |
|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | 19 |
| සේවක සංඛ්‍යාව | 1 |
| 2012-12-31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. 6.22 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. 0.024 |

## 10. සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය (නිස්කෝ)

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො.2689 |
| ලියාපදිංචි දිනය | : | 1986.01.01 |

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ ආර්ථික, අධ්‍යාපනික, සමාජීය, සංස්කෘතික හා ක්‍රීඩාමය අවශ්‍යතා සමුපකාර ප්‍රතිපත්ති අනුව සපුරාලීම මෙහි පරමාර්ථ වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- මුද්‍රණ අංශය
- රථවාහන අංශය
- මුද්‍රණ ලිපි ද්‍රව්‍ය අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 25 |
| සේවක සංඛ්‍යාව | | 11 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 22.45 |
| වර්ෂයේ ශුද්ධ ඌණතාවය | රු.මි. | 3.2 |

## 11. සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සී.1227 |
| ලියාපදිංචි දිනය | : | 1952.02.02 |

මෙම සංගමය ධීවර සමුපකාර සමිතිවල සංවර්ධනය සඳහා ආරම්භ විය. තම සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජීය තත්ත්වය උසස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමේ මැදිහත්කරු වශයෙන් ක්‍රියා කිරීම මෙම සංගමය මගින් සලසනු ලබන සේවාවන් වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- ණය පහසුකම් හා සේවා අංශය
- ගොඩනැගිලි කළමනාකරණය හා සේවා අංශය
- වාහන නැවතුම් කුලී අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 60 |
| සේවක සංඛ්‍යාව | | 04 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 10.1 |
| වර්ෂයේ ශුද්ධ ඌනතාවය | රු.මි. | 1.1 |

## 12. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති සම්පත් කළමනාකරණ සංධානය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සමු. 30 |
| ලියාපදිංචි දිනය | : | 2005.11.21 |

සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සංවිධාන එකී ආයතන වල සාමාජිකත්වයේ ආර්ථික හා සමාජ සංවර්ධන උන්නතිය උදෙසා මූල්‍ය කළමණාකරණ සේවා ප්‍රමුඛ කර ගත් උපදේශකයෙකු, නියෝජිතයෙකු, ආරක්ෂකයෙකු, මඟ පෙන්වන්නෙකු ලෙස ක්‍රියා කරමින් සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිති ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම මෙහි මෙහෙවර වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- මූල්‍ය අංශය
- අධ්‍යාපන සේවා අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 07 |
| සේවක සංඛ්‍යාව | | 03 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 20.9 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 0.1 |

## 13. සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සමු.29 |
| ලියාපදිංචි දිනය | : | 2003.10.07 |

සමුපකාර ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම සංගමයේ සාමාජික සමිති හා සංගම් වල ආර්ථික තත්ත්වය හා කාර්ය සාධනය වර්ධනය කිරීමත්, එකිනෙකාගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීමත්, මහ සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් සංවර්ධන හා ආර්ථික කටයුතු කිරීමත් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යනු ලබන සමුපකාර සමිති හා සංගම් ද විවිධ සේවා සමුපකාර සමිති ද වෙනුවෙන් එහි නියාමකයෙකු ලෙස, ආරක්ෂකයෙකු ලෙස , නියෝජිතයෙකු ලෙස, ප්‍රචාරකයෙකු හා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් නියෝජනය කරන්නෙකු ලෙස කටයුතු කිරීමත් මෙහි පරමාර්ථයන් අතර වේ. ව්‍යාපාරික හා

සේවා අංශ ලෙසට තේ කුඩු පැකට් කර අලෙවි කිරීමේ අංශය පවත්වාගෙන යනු ලබයි.

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 06 |
| සේවක සංඛ්‍යාව | | 01 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 3.1 |
| වර්ෂයේ ශුද්ධ ඌනතාවය | රු.මි. | 0.02 |

## 14. සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය

| | |
|---|---|
| ලියාපදිංචි අංකය | සමු. 33 |
| ලියාපදිංචි දිනය | 2007.02.23 |

ශ්‍රී ලංකාවේ මහජනතාව සහ සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම, ප්‍රතිකාර ලබාදීම හා නිරෝගි ජනතාවක් බිහි කිරීම පිණිස සංගමයේ සාමාජික සමුපකාර සමිති වලට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම මහා සංගමයේ පරමාර්ථය වන්නේය. මෙම සංගමය සමුපකාර ප්‍රජාවගේ සෞඛ්‍ය සංවර්ධනය හා පවුල්වල සෞඛ්‍ය ආරක්ෂණය සනීපාරක්ෂාව පිළිබඳ නිරවුල් අවබෝධය, ඉදිරි රෝගී තත්ත්වයන් පිළිබඳව පෙර සූදානම හා අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ප්‍රජාපාදිත සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන කටයුතු වල යෙදේ. මෙම සංගමය විසින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් හෙද පුහුණුව හා සෞඛ්‍ය සම්බන්ධිත කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) යන ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරයි.

ව්‍යාපාරික හා සේවා අංශ

- අධ්‍යාපන හා පුහුණු අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 10 |
| සේවක සංඛ්‍යාව | | 04 |
| 2012.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 0.4 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 0.05 |

# 04 පරිච්ඡේදය

## දීපව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති

දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණයට හා මෙහෙයවීමට යටත්ව දීපව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති 37 ක් 2012 වර්ෂය තුල ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02 කට වර්ග කර දැක්විය හැකිය.

4.1. දීපව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
4.2. දීපව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමුපකාර සමිති

### 4.1 දීපව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

මෙහි සමිති ප්‍රධාන වර්ග දෙකකට අයත් වේ.

4.1.1. දීපව්‍යාප්ත ආයතනික සේවක ස.ණ.ස. සමිති
4.1.2. දීපව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති

### 4.1.1 දීපව්‍යාප්ත ආයතනික සේවක ස.ණ.ස සමිති

**මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්**

- සමිතියේ සාමාජිකත්වය හිමි ආයතනික සේවකයන්ගේ ඉතුරුම් රාශිකරණය
- සමාජිකත්වයට ණය පහසුකම් සපයා දීම
- සාමාජික සුභ සාධනයට පියවර ගැනීම. (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික හා වෙනත් අන්‍යෝන්‍යාධාර ක්‍රම වැඩි දියුණු කර පවත්වාගෙන යාම)
- වෙනත් සේවා සැපයීම, (විශ්‍රාම ශාලා/ නිවාඩු නිකේතන / උකස් සේවා/ මුද්‍රණාල පහසුකම්/ රක්‍ෂණ නියෝජිත සේවා)
- සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය පහසුකරලීමේ ආර්ථික හා සාමාජීය කටයුතු වල යෙදීම

### 4.1.2 දීපව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති

- සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය

(මෙම සමිති වල සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා මෙම වාර්තාවේ අංක 04 දරන උපලේඛණයේ දක්වා ඇත.)

## 4.2 දීපව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමුපකාර සමිති

මෙම කාණ්ඩයට අයත් පහත සඳහන් සමුපකාර සමිති 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක වී ඇත.

- සී/ස වානේ කර්මාන්ත සමුපකාර සමිතිය
- සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය
- සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය
- සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලැටි හා උඩවැඩියා වවන්නන්ගේ සමුපකාර සමිතිය
- සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය.
- සී/ස බන්ධනාගාර සේවා සැපයුම් සහ ගොඩනැගිලි ඉදිකිරීම් කම්කරු සමුපකාර සමිතිය
- සී/ස ශ්‍රී ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය
- සී/ස නිවාස හා දේපල සංවර්ධන සමුපකාර සමිතිය
- සී/ස සමස්ත ලංකා කෘෂි කාර්මික සමුපකාර සමිතිය

(මෙම සමිති වල සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා මෙම වාර්තාවේ අංක 05 දරණ උපලේඛනයේ දක්වා ඇත.)

# 05 පරිච්ඡේදය

**උපලේඛන අංක 01**
**2012 වර්ෂය සඳහා රජයේ අයවැය මගින් වෙන්කළ**
**මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම**
**පුනරාවර්තන වියදම්**

| වැය විෂය අංකය | කාණ්ඩය / වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2012.12.31 දිනට මුළු වියදම රු.මි. |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 22.600 | 16.914 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 0.735 | 0.734 |
| 1003 | වෙනත් දීමනා | 9.050 | 9.002 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 1.575 | 1.574 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 0.630 | 0.564 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1.365 | 1.364 |
| 1202 | ඉන්ධන | 1.315 | 1.315 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 0.105 | 0.104 |
| 1301 | වාහන | 1.545 | 1.523 |
| 1302 | යන්ත්‍ර හා උපකරණ | 0.820 | 0.789 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 1.050 | 0.976 |
| 1403 | විදුලිය හා ජලය | 2.325 | 2.230 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 3.057 | - |
| 1405 | වෙනත් | 1.630 | 1.606 |
| 1505 | සම්මාදම් හා දායක මුදල් | 0.315 | 0.265 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 0.505 | 0.465 |
| | එකතුව | 48.622 | 39.425 |

# මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය / වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2012.12.31 දිනට මුළු වියදම රු.මි. |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.200 | - |
| 2003 | වාහන | 0.600 | 0.362 |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 0.075 | 0.074 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (වාහන අළුත්වැඩියා කිරීමේ උපකරණ, විද්‍යුත් උපකරණ) | 0.066 | 0.066 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 0.100 | 0.062 |
| 1-2502 | මහපොළ ප්‍රදර්ශනය හා පුහුණු | 0.300 | - |
| 2-2502 | ජාතික සමුපකාර දිනය | 3.000 | - |
| 3-2502 | දැයට කිරුළ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය | 2.000 | 0.039 |
| 4-2502 | පාලන වාර්තාව හා සංඛ්‍යා ලේඛන වාර්තාව මුද්‍රණය | 0.500 | 0.217 |
| 2502 | සමුපකාර ප්‍රචාරණය (සමූප දීපනි පුවත්පත මුද්‍රණය) | 7.850 | 6.019 |
| | එකතුව | 14.691 | 6.839 |

## වියදම් එකතුව

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2012.12.31 දිනට මුළු වියදම රු.මි. |
|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් එකතුව | 48.622 | 39.425 |
| 2 | මූලධන වියදම් එකතුව | 14.691 | 6.839 |
| | මුළු එකතුව | 63.313 | 46.264 |

### උපලේඛන අංක 02
# ජාතික මට්ටමේ සමුපකාර සංගම්
### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2012 වර්ෂය

| සංගමයේ නම | | සාමජික/සංගම් සමිති සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 41 | 49 |
| 02. | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | 493 | 18 |
| 03. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය | 13 | 13 |
| 04. | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 257 | 133 |
| 05. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 157 | 107 |
| 06. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 186 | 36 |
| 07. | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 08 | 24 |
| 08. | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂකර්මාන්ත සංගමය | 12 | 05 |
| 09. | සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය | 19 | 01 |
| 10. | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | 25 | 11 |
| 11. | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 60 | 04 |
| 12. | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | 07 | 03 |
| 13. | සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය | 06 | 02 |
| 14. | සී/ස ආරෝග්‍ය ශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය. | 10 | 04 |

### උපලේඛන අංක 03

## දීප ව්‍යාප්ත ආයතනික මූල්‍ය සේවා සමුපකාර සමිති

### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2012 වර්ෂය

| සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01. සි/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු සහ සුභසාධක සමුපකාර සමිතිය | 610 | 02 |
| 02. සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 795 | 02 |
| 03. සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | 12797 | 30 |
| 04. සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම් සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය | 38114 | 76 |
| 05. සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය | 3430 | නැත |
| 06. සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක බැංකු සමිතිය | 12437 | 37 |
| 07. සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය. | 143301 | 620 |
| 08. සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 3906 | 09 |
| 09. සී/ස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර බැංකුව | 1075 | 03 |
| 10. සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ ණය දෙන සමිතිය | 610 | 02 |
| 11. සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | 148 | 01 |
| 12. සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 16307 | 27 |
| 13. සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | 4432 | 09 |
| 14. සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | 3393 | 08 |
| 15. සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභසාධක සහ ණය දෙන සමිතිය. | 1848 | 04 |
| 16. සී/ස සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ගේ ණයදෙන සමුපකාර සමිතිය | 11 | නැත |
| 17. සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 266 | 01 |
| 18. සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායිය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 1386 | 06 |
| 19. සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | 7542 | 19 |
| 20. සී/ස මිනින්දෝරු (මැනුම්) දෙපාර්තමේන්තුවේ මැනුම් සහායක වරුන්ගේ සකසුරුවම් හා ණයගණුදෙනු පිළිබඳ සුභසාධක සමුපකාර සමිතිය | 1154 | නැත |
| 21. සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරි සේවකයින්ගේ සුභසාධක සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 3854 | 05 |
| 22. සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සණස සමිතිය | 520 | 01 |
| 23. සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 5866 | 05 |
| 24. සී/ස වතු සේවා නිලධාරින්ගේ නිවාස සමුපකාර සමිතිය | 2136 | 01 |
| 25. සී/ස ජල සම්පාදන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 114 | නැත |
| 26. සී/ස රාජ්‍ය සේවා උපාධිධාරි සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 55 | නැත |
| 27. සී/ස රජරට විශ්වවිද්‍යාලීය සමුපකාර සමිතිය | 11 | නැත |
| 28. සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය | 62 | නැත |

## උපලේඛන අංක 04
# දීප ව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති
### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2012 වර්ෂය

| සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01. සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 51048 | 40 |

## උපලේඛන අංක 05
# දීප ව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමුපකාර සමිති
### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2012 වර්ෂය

| සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01. සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 57 | 07 |
| 02. සී/ස වානේ කර්මාන්ත සමුපකාර සමිතිය | 34 | 12 |
| 03. සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | 316 | 14 |
| 04. සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | 4909 | 12 |
| 05. සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | 337 | 01 |
| 06. සී/ස සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය | 409 | නැත |
| 07. සී/ස සමස්ත ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය | 90 | 03 |